**යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (US$ 12.20 Mn) - 2021**

---

යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එලඹී අංක 3706 - එස්ආර්අයි (සීඑළ්) දරන ණය ගිවිසුමේ VI ව්‍යාස්ථාවේ 4.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 09 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ ප්‍රමුඛතා නාගරික ව්‍යාපෘති සඳහා ඉහළ මට්ටමේ සූදානමක් ඇති කරගැනීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,879 කට සමාන එජඩො මිලියන 12.20ක් වන අතර ඉන් රු.මිලියන 1,540කට සමාන එජඩො මිලියන 10ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 338.85කට සමාන එජඩො මිලියන 12.20ක් ශ්‍රී ලංකා රජය මූල්‍යනය කරනු ලැබේ. ඉන් රු.මිලියන 884කට සමාන එජඩො මිලියන 5.74ක් පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණු අතර ඉතිරි මුදල වූ රු. මිලියන 995කට සමාන එජඩො මිලියන 6.46ක් මහානාගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 ජුනි 01 දින ආරම්භ කර තිබුණු අතර 2022 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීතිරීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | තාක්ෂණික සහය ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන නාගරික ව්‍යාපෘතිවලට මූලික පහසුකම් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එ.ජ.ඩො මිලියන 05ක ණය මුදලක් අනුමත කර තිබුණි. කෙසේවෙතත්, චක්‍රලේඛයේ | වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් සොයා බැලීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත. | චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කළ යුතු අතර වැඩිපුර කරන ලද ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 3.2.1 වගන්තියට පටහැනිව ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ සඳහා මසකට රු.60,000 බැගින් එකතුව රු. 960,000ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව පුරනැගුම ව්‍යාපෘතියේ මූල්‍ය විශ්ලේෂක වැඩ බලන පදනම යටතේ මෙම ව්‍යාපෘතියේ ගණකාධිකාරී ලෙස පත්කරමින් එකතුව රු.675,000 ගෙවා තිබුණි. | වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් සොයා බැලීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත. | චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කළ යුතු අතර වැඩිපුර කරන ලද ගෙවීම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | | |
|---|---|---|
| **විගණන ගැටලුව** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
| රටේ පවතින ණය සහ මූල්‍ය අවකාශය හේතුවෙන් රජය විසින් ද්විතීක නගර තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යාපෘති ක්‍රියාවලි ලැයිස්තුවෙන් ඉවත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන වියදම් රු.මිලියන 176ක් වියදම් කිරීමෙන් පසු අමාත්‍යාංශය විසින් යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පහසුකම් සැපයීමේ ව්‍යාපෘති අර්ධ වශයෙන් නිම කර අවසන් කරන ලදි. එම නිසා, ව්‍යාපෘතිය මත දරන ලද වියදම් නිෂ්කාර්ය වියදමක් බවට පත්විය. | රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිය අනුව අමාතයාංශය විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශ සහිතව 2022 වර්ෂයේ ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳ පියවර ගෙන ඇත. පසුව ව්‍යාපෘතිය ප්‍රතිස්ථාපනය සඳහා අමාත්‍යාංශ දෙක විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබුණු අතර 2022 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි මාස 24ක කාලපරිච්ඡේදයක් සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ 3706 එස්ආර් අයි දරන ණය ගිවිසුම දීර්ඝ කිරීමට 2022 මාර්තු 28 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. | නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |